# Holiday Assignments

**ADVANCE LEVEL**

**Subject: Political Science** **Grade 13** **Medium: Sinhala**

## 13 ශ්‍රේණිය

## ප්‍රශ්න පත්‍ර අංක 01

❖ **පහත ප්‍රශ්න ඇසුරින් 03කට පමණක් පිළිතුරු සපයන්න.**

01.'' නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදය ලෙසද හැඳින්වේ'' එසේ නම් මැතිවරණ ක්‍රමය මගින් ආරක්ෂා කලයුතු මූලික නිර්ණායක පදනම් කරගනිමින් මේ පිළිබඳ විග්‍රහයක් සපයන්න.

02. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයක පැවතිය යුතු ලක්ෂණ ත්‍රිත්වයක් පහත දැක්වේ. මේවා කෙටියෙන් විස්තර කරන්න.

- ව්‍යවස්ථානුකූලවාදය
- මහජන පරමාධිපත්‍යය
- සංවරණ හා තුලන

03. ආණ්ඩුක්‍රම ආකෘතියක් ලෙස ගැනෙන සන්ධීය මාදිලිය ඇමෙරිකානු ක්‍රමය ඇසුරින් විස්තර කරන්න.

04. **''13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුකල බලය විමධ්‍යගත කිරීම (Devolution) පිළිබඳ යාන්ත්‍රණය යනු ඒකීය සහ සන්ධීය මාදිලි දෙක අතර මැද ඇති ආණ්ඩුක්‍රම මාදිලියකි.''** ඒ අනුව ස්ථාපිත කරන ලද පළාත් සභා ක්‍රමය යටතේ සිදුකර ඇති බලය විමධ්‍යගතකරණය සවිස්තරව දක්වන්න.

05. රාජ්‍ය ප්‍රතිපත්ති යනු මොනවාදැයි හඳුන්වා රාජ්‍ය ප්‍රතිපත්ති හා දේශපාලන ක්‍රියාවලිය අතර ඇති සම්බන්ධතාවය විග්‍රහයට ලක් කරන්න.

# 13 ශ්‍රේණිය

## ප්‍රශ්න පත්‍ර අංක 02

### 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

❖ **පහත ප්‍රශ්න ඇසුරින් ප්‍රශ්න 03කට පමණක් පිළිතුරු සපයන්න.**

01. 1978 ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද ආණ්ඩුක්‍රම ව්‍යුහය තුළ බල කේන්ද්‍රණය සිදුවී ඇති ආකාරය විස්තර කරන්න.

02. මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධව 1978 ව්‍යවස්ථාවෙන් ගොඩනගා ඇති යාන්ත්‍රණය සවිස්තරව දක්වන්න.

03. **''අධිකරණයේ ස්වාධීනත්වය බහුමානීය සංකල්පයකි.''** මෙම ප්‍රකාශය ඒ සඳහා පදනම් වන ප්‍රධාන කොන්දේසි පාදක කරගනිමින් විස්තර කරන්න.

04. සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රමයක් ලෙස 1978 ව්‍යවස්ථාව මගින් හඳුන්වා දුන් ජනමත විචාරණය සිදුකරන ආකාරය පිළිබඳව විග්‍රහයක් සපයන්න.

05. ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්ම පිළිබඳව තේමාව මත පදනම් වෙමින් 1978 ව්‍යවස්ථාවට ගෙනආ 18 හා 19 වන ව්‍යවස්ථා සංශෝධන සංසන්දනාත්මකව විශ්ලේෂණය කරන්න.

## 13 ශ්‍රේණිය

## ප්‍රශ්න පත්‍ර අංක 03

❖ **පහත ප්‍රශ්න ඇසුරින් ප්‍රශ්න 03කට පමණක් පිළිතුරු සපයන්න.**

01. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයට අදාළව පහත ශීර්ෂ විස්තර කරන්න.
    - අධිපති ද්වි පක්ෂ ක්‍රමය.
    - වාමාංශික පක්ෂ
    - ජනවාර්ගික පක්ෂ

02. අන්තර්ජාතික දේශපාලනය තුළ ක්‍රියාත්මක පහත සංවිධාන සඳහා අදාළ ආයතන උදාහරණ ලෙස ගෙනහැර දක්වමින් විස්තර කරන්න.
    - කලාපීය සංවිධාන
    - මානව අයිතීන් ආරක්ෂණ සංවිධාන
    - මූල්‍ය සංවිධාන.

03. ගැටුම් සම්බන්ධව ක්‍රියාකිරීමේදී ප්‍රයෝජනවත් වන ප්‍රවේශ ත්‍රිත්වයක් පහත දැක්වේ. මේවා කෙටියෙන් විස්තර කරන්න.
    - මානව අවශ්‍යතා ප්‍රවේශය (Human Need Approach)
    - අනන්‍යතා අවශ්‍යතා ප්‍රවේශය (Identity Need Approach)
    - සංස්කෘතික සන්නිවේදන ප්‍රවේශය (Cultural Communication Approach)

04. **''සාමය ගොඩනැගීමේ න්‍යාය පත්‍රයේ ප්‍රධාන අවස්ථාවක් ලෙස ''ප්‍රතිසන්ධානගත වීම'' (Reconciliation) යන ක්‍රියාවලිය සැලකේ.''** මෙම මූලෝපාය ජාතික හෝ ජාත්‍යන්තර උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

05. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මෙරට දේශපාලන ඉතිහාසයේ සන්ධිස්ථානයක් වන අයුරු පෙන්වා දෙන්න.